# 2019

## වාර්ෂික කාර්ය සාධන වාර්තාව

## வருடாந்த செயலாற்றுகை அறிக்கை

## Annual Performance Report



බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යාංශය
புத்தசாசனம், கலாசாரம் மற்றும் மத அலுவல்கள் அமைச்சு
**Ministry of Buddhasasana, Cultural and Religious affairs**

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
தேசிய நூதனசாலைகள் திணைக்களம்
**DEPARTMENT OF NATIONAL MUSEUMS**

# 2019 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

## ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

## වැය ශීර්ෂ අංකය - 208

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

කොළඹ - 07

# (01). ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය:

## 1.1. හැඳින්වීම:

අංග සම්පූර්ණ කෞතුකාගාර සේවාවක් රටට ලබාදීම ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වන්නේය. මෙම අරමුණ මුදුන්පත් කර ගැනීම සඳහා ක්‍රියාකිරීමේදී සාමාන්‍ය වශයෙන් කෞතුකාගාරයක් හා සම්බන්ධ නානාවිධ කාර්යය පථයන් අතරින් අප රටට වඩාත් උචිත වන්නා වූ කාර්යය පථයන් තෝරා ගැනීමට දෙපාර්තමේන්තුවට සිදුවේ. මෙම තෝරා ගැනීමට අදාළ වන ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා දෙපාර්තමේන්තුවේ ප්‍රයෝජනය පිණිස ලබාගත හැකි විවිධ සම්පත් මෙන්ම රටේ අවශ්‍යතාවය ද සැලකීමට භාජනය කරනු ලැබේ.

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් මෙම ප්‍රතිපත්ති ප්‍රධාන කොට ම ක්‍රියාත්මක කරනු ලබන්නේ, සමස්තයක් වශයෙන් මුළු රටම නියෝජනය කෙරෙන රැස්කිරීම් සම්භාරයකින් සමන්විත වූ කොළඹ ජාතික කෞතුකාගාරය මඟිනි. මීට අමතරව කොළඹ ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරය, මහනුවර ජාතික කෞතුකාගාරය, රත්නපුර ජාතික කෞතුකාගාරය, ගාල්ල ජාතික කෞතුකාගාරය, ගාල්ල ජාතික සමුද්‍ර කෞතුකාගාරය, පිටකොටුවේ ඕලන්ද කෞතුකාගාරය, අනුරාධපුර ජන කෞතුකාගාරය, නිදහස් අනුස්මරණ කෞතුකාගාරය, හම්බන්තොට මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය හා පොළොන්නරුව පුරාණ තාක්ෂණ කෞතුකාගාරය, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව මඟින් පවත්වාගෙන යනු ලබන අතර, එම ප්‍රදේශවලට ආවේණික සංස්කෘතික සහ ස්වභාවික විද්‍යා උරුමයන් ද විදහා දැක්වීම එකී කෞතුකාගාරවල කාර්යය භාරය වේ. එසේම ජංගම  කෞතුකාගාර ප්‍රදර්ශන සහ දේශන හේතුකොට ගෙන දෙපාර්තමේන්තුවේ සේවා පථය පුළුල් වී තිබේ.

## 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු:

### (අ). ආයතනයේ දැක්ම:

සෞභාග්‍යමත් අනාගතයක් උදෙසා ජාතික උරුමය සංරක්ෂණය, ප්‍රවර්ධනය සහ ප්‍රචාරණය කිරීම ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ දැක්ම වන්නේය.

### (ආ). ආයතනයේ මෙහෙවර:

සංස්කෘතික හා ස්වභාවික උරුමයට අයත් සම්පත් විද්‍යාත්මකව හා ක්‍රමානුකූලව ආරක්ෂා කිරීම හා මහජනතාවගේ ඇගයීම, අධ්‍යාපනය සහ රසාස්වාදය  උදෙසා ඉදිරිපත් කිරීම ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ මෙහෙවර වන්නේය.

### (ඇ). ආයතනයේ අරමුණ:

අංග සම්පූර්ණ කෞතුකාගාර සේවාවක් රටට ලබාදීම ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වන්නේය.

## 1.3. ප්‍රධාන කාර්යයන්:

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව සතු ප්‍රධාන කාර්යයන් පහත පරිදි විශ්ලේෂණය කර දැක්විය හැකිය.

I. ප්‍රාග් ඉතිහාසය, මානවවංශ විද්‍යාව, මානව විද්‍යාව, සත්ත්ව විද්‍යාව, කීට විද්‍යාව, භූ විද්‍යාව හා උද්භිද විද්‍යාව යන විවිධ ක්ෂේත්‍රයන්ට අදාළ වන්නා වූ කෞතුක වස්තූන් සහ ආදර්ශ රැස්කිරීම, ලේඛනගත කිරීම, සංරක්ෂණය කිරීම සහ ආරක්ෂා කිරීම.

II. යථෝක්ත ක්ෂේත්‍රයන්හි පර්යේෂණ පැවැත්වීම.

III. විද්වතුන්ගේ මෙන්ම ආධුනිකයන්ගේ ද ප්‍රයෝජනය පිණිස, **ස්පෝලියා සෙලනිකා** නමැති පර්යේෂණ සංග්‍රහය සහ වෙනත් සඟරා සහ ඒක විෂයක සංග්‍රහයන් ප්‍රකාශයට පත් කිරීම.

IV. රටේ ඉතිහාසය, කලා ශිල්ප හා ස්වාභාවික විද්‍යාවන්ට ද අදාළ වන්නා වූ දැනුම ප්‍රචලිත කිරීම වස් කෞතුකාගාර ප්‍රදර්ශන, දේශන හා සම්මන්ත්‍රණ ආදියෙන් සමන්විත අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,

## 1.4. සංවිධාන සටහන: (ඇමුණුම: 01 බලන්න)

## 1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා කෞතුකාගාර:

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා කෞතුකාගාර පිළිබඳ තොරතුරු පහත පරිදි දැක්විය හැකිය.

### (අ). දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ:

- මානවවංශ විද්‍යා අංශය
- මානව විද්‍යා අංශය
- සත්ත්ව විද්‍යා අංශය
- කීට විද්‍යා අංශය
- භූ විද්‍යා අංශය
- උද්භිද විද්‍යා අංශය
- ජාතික කෞතුකාගාර පුස්තකාලය
- අධ්‍යාපන හා ප්‍රකාශන අංශය
- සංරක්ෂණ අංශය
- පාලන අංශය
- ගිණුම් අංශය
- අභ්‍යන්තර විගණන අංශය
- ඡායාරූප අංශය
- ප්‍රදර්ශන සැලසුම් අංශය
- තොරතුරු තාක්ෂණ අංශය

## (ආ). දෙපාර්තමේන්තුවේ යටතේ පාලනය වන කෞතුකාගාරः

- කොළඹ ජාතික කෞතුකාගාරය
- ජාතික ස්වාභාවික විද්‍යා කෞතුකාගාරය - කොළඹ
- මහනුවර ජාතික කෞතුකාගාරය
- රත්නපුර ජාතික කෞතුකාගාරය
- ගාල්ල ජාතික කෞතුකාගාරය
- ඕලන්ද කෞතුකාගාරය - පිටකොටුව
- ජන කෞතුකාගාරය - අනුරාධපුරය
- සමුද්‍ර කෞතුකාගාරය - ගාල්ල
- නිදහස් අනුස්මරණ කෞතුකාගාරය - කොළඹ
- මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය - හම්බන්තොට
- පුරාණ තාක්ෂණ කෞතුකාගාරය - පොළොන්නරුව

## (02). ප්‍රගතිය හා ඉදිරි දැක්ම:

### විශේෂ, ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක:

### (අ). විශේෂ වැඩසටහන්:

- වාර්ෂිකව මැයි මස 18 දිනට යෙදෙන ජාත්‍යන්තර කෞතුකාගාර දිනය නිමිත්තෙන් 2019 මැයි 29 දින Museums as Cultural Hub: Focus on Collection යන තේමාව යටතේ එක්දින සම්මන්ත්‍රණයක් කොළඹ ජාතික කෞතුකාගාරයේදී පවත්වන ලදී.

- රුහුණු විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා 2019.03.05 සිට 2019.04.05 දක්වා මසක ආයතනික පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

- කැළණිය විශ්ව විද්‍යාලයේ සංචරණය හා සංස්කෘතික සම්පත් කළමණාකරණය (විශේෂවේදී) ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් 2019.09.09 සිට 2019.11.08 දක්වා විශේෂ ආයතනික පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

- නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව හා එක්ව සංස්කෘතික පුනර්ජීවන වැඩසටහන නමින්, ජංගම ප්‍රදර්ශන හා දේශණ ඇතුළත් නව වැඩසටහන් මාලාවක් වසර පුරා දිවයිනේ විවිධ ප්‍රදේශවල පැවැත්වීම.

### (ආ). ජයග්‍රහණ:

- 2019.01.12 දින මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරයේ ඉදිකරන ලද ශ්‍රවනාගාරය හා යටිතල පහසුකම් පද්ධතිය විවෘත කිරීම

- 2019.02.04 දිනට යෙදුන ශ්‍රී ලංකාවේ 71 වැනි ජාතික දිනයට සමගාමීව නිදහස් චතුරශ්‍රයේ පිහිටා ඇති **'නිදහස් අනුස්මරණ කෞතුකාගාරයේ'** ප්‍රදර්ශන යාවත්කාලීන කිරීම

- 2019.07.03 දින 'රජරට නවෝදය ජනපති වැඩසටහන - **පිබිදෙමු පොළොන්නරුව** දිස්ත්‍රික් සංවර්ධන ව්‍යාපෘතිය' යටතේ පිහිටුවන ලද පොළොන්නරුව **'පුරාණ තාක්ෂණ කෞතුකාගාරය'** විවෘත කිරීම.

- 2019.11.12 දින පොළොන්නරුව පුරාණ තාක්ෂණ කෞතුකාගාරයට අනුබද්ධිතව ඉදිකළ **'ඉටි ප්‍රතිමා කෞතුකාගාරය'** විවෘත කිරීම

- කොළඹ ජාතික කෞතුකාගාරයේ සිතුවම් මැදිරියේ ප්‍රදර්ශිත සිතුවම් නැවත පිටපත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ එම සිතුවම් 35 ක් පිටපත් කර අවසන් කිරීම.

- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තු පරිශ්‍රයෙහි නරඹන්නන් සඳහා ත්‍රෛභාෂාවෙන් මාර්ගෝපදේශ පුවරු සවි කිරීම

- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තු පරිශ්‍රයෙහි නරඹන්නන් විසින් බැහැර කරනු ලබන කසල, ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ විධිමත් පරිදි කසල වෙන්කර බැහැර කිරීම සඳහා ස්ථානයක් සකස් කිරීම.

### (ඈ). ඉදිරි ඉලක්ක:

- පෞරාණික වටිනාකමකින් යුත් ඕලන්ද කෞතුකාගාරයේ සංරක්ෂණාමය අලුත්වැඩියා කටයුතු සිදුකිරීම හා ප්‍රදර්ශන මැදිරි නවීකරණය කිරීම. මෙම කටයුතු 2020 වසරේ අවසන් කිරීමට නියමිතය.
- මහනුවර යුගයට අයත් ගොඩනැගිල්ලක පිහිටුවා ඇති රත්නපුර ජාතික කෞතුකාගාරයේ සංරක්ෂණාමය අලුත්වැඩියා කටයුතු සිදුකිරීම හා ප්‍රදර්ශන මැදිරි නවීකරණය කිරීම.
- ලංකාවේ ඉතා වටිනා ඉපැරණි දුර්ලභ ග්‍රන්ථ එකතුවක් සහිත පුස්තකාලයක් වූ ජාතික කෞතුකාගාර පුස්තකාලය සඳහා ගිනි ආරක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම.
- ඓතිහාසික ස්මාරකයක් වන ජාතික කෞතුකාගාර ගොඩනැගිල්ල හා තදනුබද්ධ උද්‍යානය, උක්ත ගොඩනැගිල්ල ආශ්‍රිතව ආකර්ශණීය හා සමතුලිත පරිසර තත්ත්වයක් ඇතිකිරීම සඳහා පූර්ණ නවීකරණයක් ඇති කිරීම.

### (ඇ). අභියෝග:

- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව මඟින් සිදුකරනු ලබන සංරක්ෂණාමය අලුත්වැඩියාවන් හා වෙනත් ඉදිකිරීම් කටයුතු ඉටුකර ගන්නේ රජයේ ඉදිකිරීම් සම්බන්ධ ආයතන මඟිනි. එකී ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් අදාල ඉදිකිරීම් ආයතන අත්තිකාරම් මුදලක් හෝ සම්පූර්ණම මුදල මුලින්ම ලබාගන්නා නමුත් බොහෝ විට අදාල කාලරාමුව තුළ එකී ඉදිකිරීම් කටයුතු සිදු නොවේ. මේ නිසා වසර අවසානයේ අදාල ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතියට සමගාමීව භෞතික ප්‍රගතියක් දක්නට නොලැබේ. මෙසේ රාජ්‍ය ඉදිකිරීම් ආයතන විසින් අදාල කාලරාමුව තුළ ඉදිකිරීම් කටයුතු සිදු නොකිරීම දෙපාර්තමේන්තුවේ ඉලක්ක වෙත යාමට තිබෙන විශාල අභියෝගයකි.
- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව යටතේ ඇති කෞතුකාගාර 11 න් කෞතුකාගාර 08 ක් ම ස්ථාපිත කර ඇත්තේ වසර 100 කට වඩා පැරණි, පුරාවිද්‍යාත්මක ස්මාරක ලෙස සැලකෙන ගොඩනැගිලිවලය. මෙම පෞරාණික ගොඩනැගිලි විධිමත්ව සංරක්ෂණය කර පවත්වාගෙන යෑම අභියෝගාත්මක කාර්යයකි. එකී කාර්යය වඩාත් අභියෝගාත්මක වන්නේ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවට ඉජිනේරුවරයෙක් හා විශේෂ නඩත්තු ඒකකයක් නොමැති වීම නිසාය.
- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව යටතේ පවතින කෞතුකාගාර 11 න් 08 ක් ම පිහිටා ඇත්තේ පුරාවිද්‍යා ස්මාරක සහිත රජයේ ඉඩම්වල ය. මෙම ඉඩම්වල නීත්‍යානුකූල හිමිකම අප දෙපාර්තමේන්තුවට නොමැත. නව සංවර්ධන කාර්යයන් සිදුකිරීමේදී මෙම තත්වය බෙහෙවින් බලපානු ලබයි. එසේ වීම ඉඩම්වල නෛතිකභාවය අප දෙපාර්තමේන්තුවට ලබාගත යුතුය.

සනුජා කස්තුරිආරච්චි,
ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ ජනරාල්

(03).

## 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

| අයවැය 2019 | | සටහන | තත්‍ය | | |
|---|---|---|---|---|---|
| | | | 2019 | 2018 | |
| - | ආදායම් ලැබීම් | | | - | |
| - | ආදායම් බදු | 1 | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | 84,730,339 | - | |
| **-** | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **84,730,339** | **-** | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 289,719,000 | 305,740,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 6,398,168 | 9,062,363 | ඒසීඒ-4 |
| 9,500,000.00 | අත්තිකාරම් ගිණුම් | | 11,395,444 | 14,998,295 | ඒසීඒ-5/5(ඒ)/5(බී) |
| - | වෙනත් ලැබීම් | | | 100,484,656 | |
| **9,500,000.00** | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **307,512,612** | **430,285,314** | |
| **9,500,000.00** | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **392,242,951** | **430,285,314** | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | | |
| 169,180,000.00 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 167,205,110 | 149,256,129 | |
| 51,820,000.00 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 41,837,833 | 39,065,666 | ඒසීඒ-2(ii) |
| 1,600,000.00 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 1,539,979 | 1,582,649 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 234,333 | - | |
| **222,600,000.00** | **මුළු පුනරාවර්තන වියදම් (ඇ)** | | **210,817,256** | **189,904,444** | |
| | **මූලධන වියදම්** | | | | |
| 107,000,000.00 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 59,313,263 | 45,676,612 | |
| 13,900,000.00 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 5,823,798 | 10,460,914 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 1,200,000.00 | හැකියා වර්ධනය | 14 | 1,056,250 | 806,500 | |
| 13,900,000.00 | වෙනත් මූලධන වියදම් | 15 | 92,839,085 | 21,034,762 | |
| **136,000,000.00** | **මුළු මූලධන වියදම් (ඉ)** | | **159,032,396** | **77,978,788** | |
| 19,000,000.00 | **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | | **22,022,868** | **22,982,986** | |
| | **තැන්පතු ගෙවීම්** | | 3,431,344 | 4,000,049 | ඒසීඒ-4 |
| 19,000,000.00 | **අත්තිකාරම් ගෙවීම්** | | 18,591,524 | 18,982,937 | ඒසීඒ-5/5(ඒ)/5(බී) |
| 377,600,000.00 | **මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)** | | 391,872,520 | 290,866,218 | |
| **368,100,000.00** | **2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඈ-උ)** | | **370,431** | **139,419,096** | |



NATIONAL AUDIT OFFICE

**2019 දෙසැම්බර් 31 දිනට**

**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | සත්‍ය 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 10,834,969,981 | 10,817,342,780 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 46,280,033 | 40,444,961 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | 370,431 | - |
| **මුළු වත්කම්** | | **10,881,620,445** | **10,857,787,741** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | | 33,697,060 | 30,828,812 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 10,834,969,981 | 10,817,342,780 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 12,582,973 | 9,616,149 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 370,431 | - |
| **මුළු වගකීම්** | | **10,881,620,445** | **10,857,787,741** |

පිටු අංක 01 සිට 55 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 56 සිට 68 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ........................ | ........................ | ........................ |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ~~ප්‍රධාන මූල්‍ය නිලධාරි~~/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 2020/02/26 | දිනය : 2020.02.25 | දිනය : 2020/02/25 |
| එම්. කේ. බන්දුල හරිස්චන්ද්‍ර<br>ලේකම්<br>බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යාංශය<br>08 වන මහල, "සෙත්සිරිපාය"<br>බත්තරමුල්ල | සනූජා කස්තුරිආරච්චි<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව<br>කොළඹ 07 | ඩබ්ලිව්. එෆ්. ඩී. පී. ප්‍රනාන්දු<br>ප්‍රධාන ගණකාධිකාරි<br>අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට<br>ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව |

## 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සටහන | 2,019<br>රු. | 2018<br>රු. |
|---|---|---|---|
| **<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | | |
| මුළු බදු ලැබීම් | | 75,297,800 | 94,339,703 |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | - | - |
| ලාභ | | - | - |
| ආදායම් නොවන ලැබීම් | | 689,981 | 306,747,539 |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | | - | - |
| අග්‍රිම ලැබීම් | | 289,719,000 | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | | **365,706,782** | **401,087,242** |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | | 258,449,706 | 328,170,768 |
| සහනාධාර සහ මාරුකිරීම් | | - | - |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | 83,570,083 | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | - | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | | **342,019,789** | **328,170,768** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | | **23,686,993** | **72,916,474** |
| **<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | | |
| පොළී | | - | - |
| ලාභාංශ | | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | 103,500 | - |
| උපණය අයකර ගැනීම් | | - | - |
| අත්තිකාරම් අයකර ගැනීම් | | 1,573,966 | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | | **1,677,466** | **-** |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | | 5,823,798 | 77,978,788 |
| අත්තිකාරම් ගෙවීම් | | 18,591,524 | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | | **24,415,322** | **77,978,788** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඇ)-(ඉ)** | | **(22,737,856)** | **(77,978,788)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | | **949,137** | **(5,062,314)** |
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | | |
| දේශීය ණය ගැනීම් | | - | - |
| විදේශීය ණය ගැනීම් | | - | - |
| ප්‍රදානයන් ලැබීම් | | - | - |
| තැන්පතු ලැබීම් | | 2,075,852 | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | | **2,075,852** | **-** |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| තැන්පතු ගෙවීම් | | 3,024,989 | 5,062,314 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | | **3,024,989** | **5,062,314** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | | **(949,137)** | **(5,062,314)** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)** | | **0** | **0** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | | **-** | **-** |



NATIONAL AUDIT OFFICE

3.5. මූල්‍ය ප්‍රකාශ සටහන් :

3.6. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය රු. ,000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| නැත | නැත | නැත | නැත | 84,820,284 | |

3.7. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන<br>ප්‍රාග්ධන | 210,000,000<br>136,000,000 | 222,600,000<br>136,000,000 | 210,752,162<br>75,439,299 | 95%<br>55% |

3.8. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන,ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසන් ප්‍රතිපාදන | | |
| 01 | අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් පාලන අමාත්‍යාංශය<br><br>155-2-13-2-2509 | නාගරික සංවර්ධනය | | 93,000,000 | 83,958,419 | 90% |

## 3.9. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2019 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2019 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | | 800,000,000 | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | | 33,095,640 | | |
| 9153 | ඉඩම් | | 10,001,869,340 | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | | |
| 9160 | කෙරී ගෙන යන වැඩ | | | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | | | |

## 3.10. විගණකාධිපතිවරයාගේ වාර්තාව

** පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ දී විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව පරිලෝකනය (SCAN) කොට මෙහි අන්තර්ගත කළ යුතුය.

(85)

# ජාතික විගණන කාර්යාලය

# தேசிய கணக்காய்வு அலுவலகம்

# NATIONAL AUDIT OFFICE

| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | සීඒඑස්/සී/එම්යූ/2/එෆ්එස්/19 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2020 ජූනි 24 දින |

ගණන්දීමේ නිලධාරී

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

**ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

යථෝක්ත සම්පිණ්ඩන වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන මේ සමඟ එවා ඇත.

එච්.ජී.සරත්

සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත්:- 1. අධ්‍යක්ෂ ජනරාල් , රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව - සම්පිණ්ඩන වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන එවා ඇත.

2. ප්‍රධාන ගණන් දීමේ නිලධාරී, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මගේ අංකය / எனது இல. / My No. : සිජ්එස්/සී/එම්යූ/2/එෆ්එස්/19
ඔබේ අංකය / உமது இல. / Your No. :
දිනය / திகதி / Date : 2020 ජුනි 24 දින

ගණන්දීමේ නිලධාරී

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

**ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්වාගණනය කළ මතය**

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙළ කළ එම මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යයසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක

අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

  මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම් ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඡේද යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|
| (i) 1.6.5 | දෙපාර්තමේන්තුවට අයත් ලක්සල ගොඩනැගිල්ල වෙනුවෙන් රු. 602,217ක් වරිපනම් ලෙස ගෙවා තිබුණද ගොඩනැගිල්ලේ තක්සේරු වාර්තාවේ මුල් පිටපත ඉදිරිපත් නොකෙරුණි . | ලක්සල ගොඩනැගිල්ලේ තක්සේරු වාර්තාවේ මුල් පිටපත විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. |
| (ii) 1.2.4(ආ) | 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂ වටිනාකම සටහන් කිරීමේදී 2017 වර්ෂය අවසානයට විසර්ජන ගිණුමේ පැවති ශේෂයට වඩා රු.216,587,551 ක් අඩුවෙන් දක්වා තිබුණද අදාළ නිවැරදි කිරීම් සමාලෝචිත වර්ෂයේදී හෝ සිදුකර නොතිබුණි. | 2017 වර්ෂයේ අවසාන ශේෂය 2018 ජනවාරි 01 දිනට පෙන්නුම් කර මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතුය. |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

#### 1.6.1.1 දේපල පිරියත හා උපකරණ

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2018 වර්ෂය වෙනුවෙන් සිදුකර තිබුණු භාණ්ඩ සමීක්ෂණයෙන් අනතුරුව කාර්යාල උපකරණ පරිගණක විදුලි උපකරණ හා ලිබඩු ඇතුළු විවිධ ඉන්වෙන්ට්‍රිගත භාණ්ඩ 2019 වර්ෂයේදී වෙන්දේසි කර විකිණීම් කර තිබුණද අපහරණයන් යටතේ එම වටිනාකම් ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි.

(ආ) වියදම් ප්‍රකාශය අනුව මූලධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා රු.5,823,798 ක් වැය කර තිබුණද එය මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ රු.3,954,457 ක් විය. ඒ අනුව රු.1,869,341 ක් අඩුවෙන් දක්වා තිබුණු අතර වෙනසට හේතු පැහැදිලි නොකෙරිණි.

### 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛය/ මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර 11 වැනි පරිශිෂ්ටය | යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| (ii) | පරිගණක මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (iii) | ඇප ලේඛනය | මු.රෙ.891(1) | ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (iv) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මු.රෙ.454(2) | පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (v) | ඉන්ධන හා ලිහිසි තෙල් තොග පොත | මු.රෙ.1647(ඈ) | පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (vi) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මු.රෙ.1647(ඉ) | පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (vii) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණික ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 | ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.2 අවිධිමත් ගනුදෙනු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මුදල් රෙගුලාසි.139(4) අනුව ගෙවනු ලබන සෑම ගෙවීම් වවුචරයකටම විධිමත් කුවිතාන්සියක් ලබා ගත යුතු වුවත් 2018 දෙසැම්බර් 31 දිනැති රු.18,104,879 වටිනා චෙක්පත් 11 ක් 2019 මැයි 27 දින වනවිටත් නිකුත් නොකර ගණකාධිකාරී වෙත රඳවා ගෙන තිබුණි.

(ආ) 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 05 ක හා 2018 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 01 ක ඉතිරි වූ මුදල් එකතුව රු.2,201,775 ක් දෙපාර්තමේන්තු ආපනශාලාව නවීකරණය කිරීමේ කටයුතු වෙනුවෙන් කොන්ත්‍රාත්කරුගෙන් හිලව් කර ගෙන තිබුණි.

## 2.3 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

සේවය හැරගිය නිලධාරීන් 11 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,074,934 ක ණය ශේෂවල වර්ෂ 14 සිට වර්ෂ 25 දක්වා පැරණි ණය ශේෂ පැවති අතර අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි

## 2.4 බැංකු ගිණුම් මෙහෙයවීම

(අ) දෙපාර්තමේන්තුව විසින් නිකුත්කළ ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ට වැඩි කල් ඉකුත් වූ වටිනාකම රු.9,035 ක් වූ චෙක්පත් 12 ක් සම්බන්ධයෙන් මු.රෙ.396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) චෙක්පතක වලංගුකාලය දීර්ඝ කිරීමේදී මු.රෙ.391 නියමයන්ට අනුකූලව කටයුතු කර නොතිබුණු අතර 2018 දෙසැම්බර් මාසයේ ලියන ලද චෙක්පත් 02 ක් සඳහා 2019 ඔක්තෝබර් මාසයේදී රු.5,194,149 ක් ගෙවා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය හා කාර්ය සාධනය

ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මෙහෙයුම් සමාලෝචනය , තිරසාර සංවර්ධනය යහපාලනය හා මානව සම්පත් කළමනාකරණයට අදාළ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ලැබේ.

එච්.ජී.සරත්
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

# (04). කාර්ය සාධන දර්ශකඃ

## 4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)ඃ

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% -74% |
| කොළඹ ජාතික කෞතුකාගාර සිතුවම් මැදිරියේ ප්‍රදර්ශනය කර තබා ඇති චිත්‍ර පිටපත් කිරීම. (සංරක්ෂණය ) | - | 80% | - |
| මානව වංශ විද්‍යා අංශයේ ඇති පැරණි කාසි සංරක්ෂණය හා නිවැරදි ලෙස ගබඩා කිරීම. | 100% | - | - |
| කීට විද්‍යා මැදිරිය නවීකරණය . | - | 80% | - |

## (05). තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය:

### 5.1. හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග:

| ඉලක්කය / අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75% - 100% |
| **ප්‍රධාන අරමුණ:**<br>ශ්‍රී ලංකාවේ කෞතුක වස්තූන් හා ඒවා පිළිබඳ තොරතුරු එක් රැස් කිරීම, ඒවා නිසි පරිදි සංරක්ෂණය කිරීම, කළමනාකරණය සහ ඒවායේ වටිනාකම නිරවද්‍යව හා වගකීමකින් යුක්තව ජනතාවට උරුම කර දීම, | | | | | |
| 1 . කෞතුකාගාර අධ්‍යාපනය පුළුල් කිරීම සඳහා කෞතුකාගාර ප්‍රවර්ධන කිරීම. | • පොළොන්නරුව පුරාණ තාක්ෂණ උරුම කෞතුකාගාරය පිහිටු වීම. | • පැරණි තාක්ෂණික ක්‍රමවේදයන් ජනතාවට හඳුන්වා දෙන මැදිරිවලින් යුතු දැනුම සපිරි නව තාක්ෂණය සහිත කෞතුකාගාර | | | 100% |
| 2 අනාගත අභිවෘද්ධිය උදෙසා විවිධ කෞතුක වස්තූන් ප්‍රශස්ත අයුරින් සංරක්ෂණය කිරීම. | • කොළඹ ජාතික කෞතුකාගාර සිතුවම් මැදිරියේ ප්‍රදර්ශනය කර තබා ඇති චිත්‍ර පිටපත් කිරීම. (සංරක්ෂණය ) | • පිටපත් සංරක්ෂණය කරන ලද චිත්‍ර 58 කි. | | | 80% |
| 3 . ඓතිහාසික සංස්කෘතික, විද්‍යාත්මක හා කලාත්මක උරුමයන්හි දැනුම හා අවබෝධය ජනතාව වෙත ලබා දීම. | • මානව වංශ විද්‍යා අංශයේ ඇති පැරණි කාසි සංරක්ෂණය හා නිවැරදි ලෙස ගබඩා කිරීම. | • සංරක්ෂණය කරන ලද කාසි 80000 කි. | | | 100% |

| | | | | | |
|---|---|---|---|---|---|
| | • කීට විද්‍යා මැදිරිය නවීකරණය . | • කීට විද්‍යා මැදිරිය මහජනතාව වෙත ප්‍රදර්ශනය | | | 80% |
| | • පුස්තකාලය ප්‍රතිසංවිධාන කටයුතු වල මූලික පියවර ආරම්භ කිරීම. | • දුර්ලභ ග්‍රන්ථ එකතුව විධිමත් කොට යාවත්කාලීන කිරීම හා පිරිසැකසුම් කර රාක්ක සංවිධානය කිරීම | | | 100% |
| | • භූ විද්‍යා අංශයේ ඛනිජ එකතුව යාවත්කාලීන කිරීම, උප එකතුවක් ඡායාරූප ගත කිරීම, තොරතුරු යාවත්කාලීන කිරීම, නව පරිත්‍යාග හා ලියාපදිංචි ලේඛනගත කිරීම. | • ඛනිජ 580 කි | | | 100% |
| | • සත්ත්ව විද්‍යා අංශයේ තෙත් සංරක්ෂිත WHT එකතුවේ උභයජීවී විශේෂ කාණ්ඩය හඳුනා නොගත් නිදර්ශක හඳුනා ගැනීම, ලියාපදිංචි කිරීම, ලේඛන ගත කිරීම සහ යාවත්කාලීන කිරීම. | • ලේඛන ගත කර අවසන් කරන ලද 2017 සම්පූර්ණ එකතුව . | | | 100% |
| | • සත්ත්ව විද්‍යා අංශයේ තෙත් සංරක්ෂිත Holotype සහ Paratype ඇතුළු Type එකතුව නැවත සංරක්ෂණය<br>P.T - 202<br>H.T - 220 | • Holotype සහ Paratype - 422 සම්පූර්ණ ලේඛනගත කිරීම. | | | 100% |

## 5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග:

- තිරසර සංවර්ධන ව්‍යාපෘති සඳහා මුදල් අනුමත වී තිබුන ද බොහෝවිට වර්ෂ අවසානය වන විට ලැබෙන්නේ අදාල අනුමත ප්‍රතිපාදනවලින් ප්‍රතිශතයක් පමණි. මෙය තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමට ඇති අභියෝගයකි.
- ජාතික කෞතුකාගාර පුස්තකාලයේ පුස්තකාලයාධිපති තනතුර අධිශ්‍රේණියේ පුස්තකාලයාධිපති තනතුරකි. නමුත් දැනට වසර 12 ක පමණ සිට එම තනතුර පුරප්පාඩු වී ඇත. මෙසේ විෂය දැනුම ඇති අධි ශ්‍රේණියේ පුස්තකාලයාධිපතිවරයෙකු නොමැති වීම පුස්තකාල ප්‍රතිසංවිධාන කටයුතුවලදී විශාල අභියෝගයක් වී ඇත.

## (06). මානව සම්පත් පැතිකඩ:

### 6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / අතිරික්ත |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 16 | 8 | 8 |
| තෘතීයික | 5 | 2 | 3 |
| ද්විතීයික | 153 | 90 | 63 |
| ප්‍රාථමික | 303 | 247 | 56 |

### 6.2. ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලබන ආකාරය :

- දෙපාර්තමේන්තුවේ විෂයානුබද්ධ තනතුරු වන ජ්‍යෙෂ්ඨ හා තෘතීයක මට්ටමේ තනතුරු 11 ක ප්‍රමාණයක් පුරප්පාඩු පැවතීම හේතු කරගෙන දෙපාර්තමේන්තුවේ අංශ හා ප්‍රාදේශිය කෞතුකාගාරවල අධීක්ෂණ කටයුතු සිදුකර ගැනීම හා පර්යේෂණ හා අධ්‍යයන කටයුතු සඳහා සීමිත මාණ්ඩලික නිලධාරීන් පිරිසක් යෙදවීමට සිදුවීම බාධාකාරී වී ඇති අතර එම බඳවා ගැනීම කඩිනමින් කර දෙන මෙන් ඉල්ලා රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය වෙත දැනුම් දී ඇත.

- දෙපාර්තමේන්තුව විසින් බඳවා ගැනීම් සිදුකිරීමට හැකි තනතුරුවලට අදාල සියලුම බඳවාගැනීම් පටිපාටි අනුමත කරවාගෙන ඇති අතර ද්විතීයික හා ප්‍රාථමික ගණයට අයත් එම තනතුරු සඳහා බඳවාගැනීම් කඩිනමින් සිදු කිරීමට අපේක්ෂිතය.

## 6.3. මානව සම්පත් සංවර්ධනය:

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.000) | | වැඩසටහනේ ස්වභාවය දේශීය / විදේශීය | නිමැවුම / ලබාගත් දැනුම * |
|---|---|---|---|---|---|---|
| Outbound Training | 43 | 2019.07.15 - 16 | 750000<br>12480<br>(ප්‍රවාහන වියදම්) | - | දේශීය | |
| Advance MS Excel for Junior Officer | 01 | 2019.05.30 - 31 | 13000 | - | දේශීය | |
| වැටුප් පරිවර්තනය | 05 | 2019.03.18 - 19 | 42500 | - | දේශීය | |
| රියදුරන් සඳහා විද්‍යාත්මක පිරිමැසුම්දායක හා ආරක්ෂිත රිය පැදවීම | 03 | 2019.04.04 | 9750 | - | දේශීය | |
| ගිණුම් පොත්පත් ක්‍රමානුකූලව නඩත්තු කිරීම | 05 | 2019.02.28 -<br>2019.03.01 | 42500 | - | දේශීය | |
| නිවාඩු ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම | 02 | 2019.07.25 - 26 | 17000 | - | දේශීය | |
| විදුලි ජනක යන්ත්‍ර භාවිතය හා නඩත්තුව | 02 | 2019.10.03 - 04 | 16000 | - | දේශීය | |
| Salary Conversation | 01 | 2019.10.24 - 25 | 8500 | - | දේශීය | |
| Salary Preparation & Revision | 01 | 2019.11.28<br>2019.12.19 | 7500 | - | දේශීය | |
| ‘‘කොහා’’ මෘදුකාංගය ස්ථාපිත කිරීම | 03 | 2019.12.24 -<br>2019.12.25 | 15000 | - | දේශීය | |
| Upcoming installation of the joint exhibition of Asian Civitation | 01 | 2019.05.07<br>2019.05.11 | - | අනියම්<br>200 US $ | විදේශීය | |
| Upcoming installation of the joint exhibition of Asian Civitation | 01 | 2019.08.11 -<br>2019.08.15 | - | අනියම්<br>200 US $ | විදේශීය | |
| The spectrum of Asia – An Exhibition of Asian civilization | 01 | 2019.09.19 -<br>2019.09.24 | - | අනියම්<br>240 US $<br>උණුසුම් ඇඳුම් දීමනා<br>75 Pounds | විදේශීය | |
| The British Museum International Training Program | 01 | 2019.07.08 -<br>2019.08.16 | - | - | විදේශීය | |
| The 2nd ACPCS workshop | 01 | 2019.06.18 -<br>2019.06.22 | - | අනියම්<br>200 US $ | විදේශීය | |
| The Entrepreneurship Developing Program in Science Museum | 01 | 2019.11.18 -<br>2019.11.27 | - | අනියම්<br>400 US $<br>උණුසුම් ඇඳුම් දීමනා<br>75 Pounds | විදේශීය | |

*** ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායකවීම:**

- රාජ්‍ය කළමනාකරණ නිලධාරි, රියදුරු හා විදුලි කාර්මික තනතුරුවලට අදාල සේවක මණ්ඩලය සඳහා තම එදිනෙදා රාජකාරිවලට අදාල දැනුම යාවත්කාලීන කිරීමේ අරමුණින් තෝරාගත් පුහුණු පාඨමාලා සඳහා එම කාර්ය මණ්ඩලය යොමු කරන ලදි. සේවාරම්භක පුහුණුවකින් තොරව මුල් පත්වීම ලබා මෙම දෙපාර්තමේන්තුවේ සේවයට වාර්තා කළ රාජ්‍ය කළමනාකරණ නිලධාරීන් එම පුහුණු සඳහා යොමු කිරීම තුළින් දෛනික රාජකාරි පහසුවෙන් හා විධිමත්ව සිදුකර ගැනීම සඳහා පරිචයක් ලබා දීමට හැකි විය. මෙමඟින් ඔවුන්ගේ රාජකාරිවල ගුණාත්මකබව වර්ධනය කරගැනමට හැකියාව ලැබී ඇත.

- එමෙන්ම, දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික සේවාගණයට අයත් තනතුරුවලට අදාල කාර්ය මණ්ඩලය නායකත්ව පුහුණු වැඩසටහනක් සඳහා යොමු කිරීම තුලින් එකම සේවා ස්ථානයක දිගුකාලීනව සේවයේ යෙදීම හේතුවෙන් මතු වී ඇති ඒකාකාරීබවින් මිදීමට අවස්ථාව සැලසීම හා ධනාත්මක ආකල්ප වර්ධනය මගින් පෞරුෂය හා අන්‍යෝන්‍ය සම්බන්ධතා වර්ධනය කිරීමට අවකාශය ලැබී ඇත.

07. අනුකූලතා වාර්තාව:

| අංකය | අය කරගත යුතු අවශ්‍යතාව | අනුකූල තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිළි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1.** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ. | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීනගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ. | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම) | අදාළ නැත. | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | අදාළ නැත. | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම | අදාළ නැත. | | |
| 1.6 | වෙනත් | | | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රේ. 445)** | අනුකූල වේ. | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.10 | හැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 445)** | අනුකූල වේ. | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ. | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ. | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ. | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිත කිරීමේදී ගණකාධිකාරීවරයාගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ. | | |
| **4** | **වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තු සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | | |
| **5** | **විගණන විමසුම** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියමකොට ඇති දිනට, සියලුම විගනන විමසුම්වලට පිළිතුරැ ලබාදී තිබීම | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා දී තිබීම | අනුකූල වේ. | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපත්වරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල නොවේ. | ප්‍රධාන ගණකාධිකාරී තනතුර පුරපුපාඩුවීම නිසා තනතුරු දෙකෙහිම වැඩබැලීමට සිදුවීම | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමණාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන ජේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධීකරණ නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර තිබීම | අනුකූල වේ. | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| 8.4 | නර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම | අනුකූල වේ. | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදුකිරීම | අනුකූල වේ. | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල වේ. | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ. | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ. | | |
| 9.6 | කල්බදු කාලසීමාවෙන් අනතුරුව බදු මාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල වේ. | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ. | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් ආවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කැ තිබීම | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| 11 | ප්‍රතිපාදන උපයෝජනය | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ. | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ. | | |
| 12 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | | | |
| 12.1 | සීමාවන්ට වලට අනුකූලවීම | අනුකූල වේ. | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කිරීම | අනුකූල වේ. | | |
| 12.3 | වර්ෂයක වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ. | | |
| 13 | පොදු තැන්පත් ගිණුම | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ. | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 14 | අග්‍රිම ගිණුම | | | |
| 14.1 | සමාලෝචන වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ. | | |
| 14.2 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ. | | |
| 14.3 | මු.රෙ.371 ප්‍රකාරව අනුමත  සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ. | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ. | | |
| 15 | ආදායම් ගිණුම | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ. | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායම බැර කර තිබීම | අනුකූල වේ. | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ. | | |
| 16.3 | 20 09 2017 දිනැති චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 17.2 | ආයතනය පිළිබද තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මර්ග හරහා ආයතනය පිළිබද මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ. | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්තිය ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2008(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ. | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2:3 ජේදයේ පරිදි පුරවැසි/සේවාලාභි ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සදහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | | | |

| | | | | |
|---|---|---|---|---|
| 19 | **මානව සම්පත් සැලසුම් සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018 01 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල නොවේ. | | 2020 වසරේදී මානව සම්පත් සැලැස්ම සකස් කෙරෙමින් පවතින බැවින් ඉදිරියේදී එය ක්‍රියාත්මක කිරීමට නියමිතය, |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල නොවේ. | | 2020 වසරේදී මානව සම්පත් සැලැස්ම සකස් කෙරෙමින් පවතින බැවින් ඉදිරියේදී එය ක්‍රියාත්මක කිරීමට නියමිතය, |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ. | | 2020 වසරේදී මානව සම්පත් සැලැස්ම සකස් කෙරෙමින් පවතින බැවින් ඉදිරියේදී එය ක්‍රියාත්මක කිරීමට නියමිතය, |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල නොවේ. | | 2020 වසරේදී මානව සම්පත් සැලැස්ම සකස් කෙරෙමින් පවතින බැවින් ඉදිරියේදී එය ක්‍රියාත්මක කිරීමට නියමිතය, |
| 20 | **විගණන ජේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ජේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ. | | |




ප්‍ර.අ.වි. - ප්‍රධාන අභ්‍යන්තර විගණන
නි.අ. - නියෝජ්‍ය විධායක
ස.අ. - සහකාර අධ්‍යක්ෂ
පරි. නි. - පරිපාලන නිලධාරී
භා.ප. - භාෂා පරිවර්තක
ප්‍ර.ග. - ප්‍රධාන ගණකාධිකාරී

ස.නි. - සංවර්ධන නිලධාරී
තො.තො.ස. - තොරතුරු තාක්ෂණ සහකාර
තො.සන්.තා.ස.- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර
ක.සේ.නි.- කළමණාකරණ සේවා නිලධාරී
කෞ.ස. - කෞතුකාගාර සහකාර
මා.ව.වි.- මානව වංශ විද්‍යා

කෞ.ආ. - කෞතුකාගාර ආරක්ෂක
ස.ක.ස.- සම්ප්‍රදායික කලා සහකාර
ප.ස.- පර්යේෂණ සහකාර
මා.වි.- මානව විද්‍යා
මා.වි.ස.-මානව විද්‍යා සහකාර
කා.නි. - කාර්මික නිලධාරී

කෞ.සේ. - කෞතුකාගාර සේවා
ප්‍ර.සැ.නි. - ප්‍රදර්ශන සැලසුම් නිලධාරී
ආ.රූ.ක. - ආදර්ශ රූප කලාකරු
ශ්‍ර.දෘ.ස. - ශ්‍රව්‍ය දෘශ්‍ය සහකාර
වි.කා. - විදුලි කාර්මික
පින්. - පින්තාරුකරු
ව.කා. - වඩු කාර්මික

පෙද. - පෙදරේරු
උ.පා - උද්‍යාන පාලක
ඡායා.ශි. -ඡායාරූප ශිල්ප
අ.ප්‍ර.නි.- අධ්‍යාපන ප්‍රවර්ධන නිලධාරී
කෞ.අ.- කෞතුකාගාර අධිකාරී
ආර.සහ. - ආරක්ෂක සහකාර
කෞතු.පිළි.නිල. - කෞතුකාගාර පිළිගැනීමේ නිලධාරී

මුර.පරි. - මුර පරීක්ෂක
සහ.මුර.පරි. - සහකාර මුර පරීක්ෂක
කෞ.මුර. - කෞතුකාගාර මුර
භූ.වි.ස.- භූ විද්‍ය සහකාර
ස.වි.ස.- සත්ත්ව විද්‍යා සහකාර
ච.ශිල්පි- චර්ම ශිල්ප
කී.වි.ස.-කීට විද්‍ය සහකාර

කොළඹ ජා.කෞ. - කොළඹ ජාතික කෞතුකාගාරය
ඕලන්ද යුග කෞ- ඕලන්ද යුග කෞතුකාගාරය
නිද.අනු.කෞ. - නිදහස් අනුස්මරණ කෞතුකාගාරය
ගාල්ල ජා.කෞ. - ගාල්ල ජාතික කෞතුකාගාරය
මාග.රුහු.උරු.කෞ. - මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය
අනු.ජන කෞ. - අනුරාධපුර ජන කෞතුකාගාරය

මහ. ජා. කෞතු- මහනුවර ජාතික කෞතුකාගාරය
පො.තා.උ.කෞ. - පොළොන්නරුව තාක්ෂණ උරුම
ස්ව.වි.කෞ- ස්වභාවික විද්‍යා කෞතුකාගාරය
රත්.ජා.කෞ.- රත්නපුර ජාතික කෞතුකාගාරය
ගාල්ල ස.කෞ. - ගාල්ල සමුද්‍ර කෞතුකාගාරය

NATIONAL MUSEUM

COLOMBO

**53, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව**
**දුරකථන - ප්‍රධාන කාර්යාලය 011 - 2694767, ෆැක්ස් - 011 - 2692092**
**ඊමේල්** - nmdep@slt.lk, **වෙබ්** -www.museum.gov.lk

53, சேர் மார்கஸ் பெர்னாந்து மாவத்தை, கொழும்பு 07, இலங்கை.
தொலைபேசி - பிரதான அலுவலகம்: 011-2694767
பெக்ஸ்: 011-2692092, மின்னஞ்சல்: **nmdep@slt.lk**, இணையம் -www.museum.gov.lk

53, Sir Marcus Fernando Mawatha, Colombo 07, Sri Lanka
Tel - General Office 011 - 2694767, Fax - 011 - 2692092
E-mail - **nmdep@slt.lk**, Web - **www.museum.gov.lk**